චක්‍රලේඛ අංක : 11/2022

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2022.08. 26

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>බඳවාගැනීමේ සුදුසුකම් සංශෝධනය</u>

බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක විවිධ සේවා සමූපකාර සමිති වල උසස් නිලතල සඳහා බඳවාගැනීම් සිදුකිරීමේදී අභ්‍යන්තර සේවකයින්ට සහ සමූපකාර විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාධාරීන්ට ප්‍රමුඛතාවයක් ලැබෙන ලෙස එකී තනතුරු වලට අදාල සුදුසුකම් සංශෝධනය කරන ලෙස කොමිෂන් සභාව වෙත විවිධ ඉල්ලීම් ලැබී ඇත. එහෙයින් සමූපකාර සේවකයින් බඳවාගැනීමේ පටිපාටිය 2011 හි සඳහන් කළමනාකරණ අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී, විධායක කළමනාකරු , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන තනතුරු වල බඳවා ගැනීමේ මූලික සුදුසුකම් උපලේඛණ අංක 01 හි දැක්වෙන පරිදි සංශෝධනය කර ඇත.

02. යම් තනතුරක් සඳහා 4/2011, 2/2020 චක්‍රලේඛය යටතේ ශ්‍රේණිගත වීම මගින් ඉහත තනතුරු සඳහා මූලික සුදුසුකම් ලෙස නිශ්චය කර ඇති තනතුරක වැටුප් පරිමානය අත් කරගෙන තිබීම හෝ එම නිශ්චය කර ඇති තනතුරුවල වැඩ බැලීම / රාජකාරි ඉටු කිරීම ඉටු කර තිබීම හෝ මෙම සංශෝධිත මූලික සුදුසුකම් යටතේ අදාල කර ගැනීමට හැකියාවක් නොමැති බව දන්වමි.

03. ඉහත සංශෝධිත සුදුසුකම් 2022.09.01 දින සිට බලපැවැත්වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එල්.පී. මනෝජා එස්. පතිරණ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.

උපලේඛණ අංක 01

# 2011 සමුපකාර සේවකයින් සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ
# කළමනාකරණ අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි ,සාමාන්‍යාධිකාරි, විධායක කළමනාකරු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරු වල සුදුසුකම් සංශෝධනය

| | තනතුරු නාමය | වැටුප් පරිමාණ අංකය | බඳවා ගැනීමේ ශ්‍රේණිය | වැටුප් පරිමාණය | උපරිම හා අවම වයස් සීමාව | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්(මූලික සුදුසුකම්) |
|---|---|---|---|---|---|---|
| 1. | කළමනාකරණ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි | 101-විශේෂ | විශේෂ | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු.35-50 | (අ) 101-විශේෂ වැටුප් පරිමාණයේ තනතුරක අවුරුදු දෙක (02) කට හෝ 101:1 වැටුප් පරිමාණයේ ප්‍රධාන විධායක නිලධාරි / සාමාන්‍යාධිකාරි තනතුරේ (ස්ථිර) වසර තුන (03) කට හෝ 101:2 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට හෝ නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම සමග පිළිගත් ආයතනයක විධායක මට්ටමේ වසර පහ (05) ක සතුටුදායක සේවා පළපුරුද්දක් හෝ ඒ හා සමාන රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් සුදුසුකම් ලබා තිබීම. |
| 3. | ප්‍රධාන විධායක නිලධාරි / සාමාන්‍යාධිකාරි | 101:1 | I | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු.35-50 | (අ) 101:1 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) ක හෝ 101:2 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක හෝ 101:3 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) ක හෝ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ සමාන සුදුසුකම් හෝ සමඟ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5. | සාමාන්‍යාධිකාරී/ විධායක කළමනාකරු | 101:2 | II | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු. 30-50 | (අ) 101:02 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) ක හෝ 101:03 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක හෝ 102:04 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) ක හෝ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ |
| | | | | | | (ආ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ 102-5 වැටුප් පරිමාණයේ තනතුරක වසර හය (06) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ පිළිගත් ආයතනයක විධායක නිලධාරි තනතුරක වසර හය (06) ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ අදාල ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර හතර (04) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 7. | ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරී/ විධායක කළමනාකරු | 101:3 | III | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු. 30-50 | (අ) 101:3 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) ක සතුටුදායක සේවා පළපුරුද්දක් හෝ 102:4 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ආ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ 102-5 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) රජය පිළිගත් ආයතනයක කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය සමග අදාල ක්ෂේත්‍රයේ විධායක/කළමනාකරණ මට්ටමේ වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ අදාල ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර තුණ (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 8. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ආයතන හා සංවර්ධන) | 102:4 | III | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු. 26-45 | (අ) 102:4 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) කට හෝ 102:5 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) කට හෝ 102:6 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට හෝ නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ආ) තනතුරේ ක්ෂේත්‍රයට අදාල වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් හෝ රජය පිළිගත් ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමාවක් හෝ සමඟ 102:6 වැටුප් පරිමාණයේ අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) තනතුරේ ක්ෂේත්‍රයට අදාල වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමග රජය පිළිගත් ආයතනයක ක්ෂේත්‍රයට අදාල අධීක්ෂණ මට්ටමේ හෝ ඊට ඉහළ තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ පිළිගත් ආයතනයක තනතුරට අදාල ක්ෂේත්‍රයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර දෙක (02) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු/මූල්‍ය) | 102:4 | III | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු. 26-45 | (අ) 102:4 වැටුප් පරිමාණයේ බැංකු / මූල්‍ය ස්ථිර තනතුරක වසර දෙක (02) කට හෝ 102:5 වැටුප් පරිමාණයේ බැංකු / මූල්‍ය ස්ථිර තනතුරක වසර තුන (03) කට හෝ 102:6 වැටුප් පරිමාණයේ බැංකු/ මූල්‍ය ස්ථිර තනතුරක වසර පහ (05) කට හෝ නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ආ) තනතුරේ ක්ෂේත්‍රයට අදාල වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් සමග 103:7 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අන්තර් මධ්‍ය සහතිකය හෝ ආවසරික II සහතිකය ලබා තිබීම හෝ සමහ පිළිගත් ආයතනයක බැංකු/මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඈ) පිළිගත් විශ්ව විශ්ව විද්‍යාලයක වාණිජ විෂය ධාරාවේ උපාධියක් හෝ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ සමග පිළිගත් ආයතනයක තනතුරට අදාල ක්ෂේත්‍රයේ වසර දෙක (02) කට නොඅඩු අධීක්ෂණ මට්ටමේ හෝ ඊට ඉහළ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |